# සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශ්‍රේණියේ

# අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

දෙපාර්තමේන්තුවට ලැබුණු තැපැල්
08 FEB 2013
ප්‍රධාන කාර්යාලය
පේරාදෙණිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : .සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය - යොමු අංකය :AD/8/3/7/111 දිනය2010.07.12

1.2 අමාත්‍යාංශය : පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන

යොමු අංකය : MLRCD/05/08/107(109) දිනය : 2010.08.19

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

යොමු අංකය : DMS/G/3/6/01 දිනය 2012..02.24

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :

යොමු අංකය : Est-3/RECRU/03/4935 දිනය : 2011.01.28

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : 2011.07.දින රහිත

යොමු අංකය : NSCC/3/6/1/SR-1 දිනය : 2011.12.27

NSCC/3/6/1/C දිනය : 2011.11.03

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :

යොමු අංකය : PSC/EST/5/1/6/1/2012 දිනය : 2012.09.27

02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 පත් කිරීම් බලධරයා- රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

03. නිලධර ගණය පිළිබඳ විස්තර

3.1 නිලධර ගණය : ප්‍රාථමික ශ්‍රේණිය අර්ධ ශිල්පීය

3.2 ශ්‍රේණි : 111, 11, 1 සහ විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : ආයතනයන්හි කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාමේදී අවශ්‍ය වන මූලික පහසුකම් සම්පාදනයට අදාල වන ඉදිකිරීම්, නඩත්තු හා අලුත්වැඩියා වැනි කාර්යයන් අතුරින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) දෙවැනි හෝ තුන්වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීනතා/ කාර්මික නිපුණතාවන් අවශ්‍ය වන්නා වූ කාර්යයන් මෙම සේවක ගණයට පැවරේ. මෙම කාර්යයන් අතුරින් පත් කිරීමේ බලධරයා විසින් ඒ ඒ තනතුරට අදාලව විශේෂිත කොට දක්වනු ලබන කාර්යයන් තනතුරට පැවරේ.

04. තනතුරේ ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : PL 2-2006-(ඒ)

5.2 වැටුප් පරිමාණය : .රු.12210-10X 130-10 X 145- 10 X 160 -12 X 170-18600/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය |
|---|---|---|
| 111 | 01 | රු.12,210 |
| 11 | 12 | රු.13,655 |
| 1 | 22 | රු.15,120 |
| විශේෂ ශ්‍රේණිය | 32 | රු.16,730 |

6. නිලධර ගණයට අයත් තනතුර / තනතුරු :-

6.1 අනුමත තනතුරු හා අනුමත තනතුරු සංඛ්‍යාව

| අනුමත තනතුරු | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| රසායනාගාර සහායක | 27 | රසායනාගාරය පිරිසිදුව හා ආරක්ෂා සහිතව තබාගැනීම.<br>රසායනාගාර උපකරණ නිසි පරිදි පවත්වාගෙන යාම හා රසායනාගාරයට අවශ්‍ය අනෙකුත් දෑ ක්‍රමවත්ව ඉටුකිරීම සඳහා වග බලා ගැනීම,පර්යේෂණ කටයුතු වලට සහය වීම,රසායනාගාර හා ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතුවලට සහය වීම.පර්යේෂණ කටයුතු හා පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු වලදී මල සතුන් ඡේදනය කිරීමට සහය වීම.<br>ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාලව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| වඩුකරු | 03 | කාර්යාලීය ලීබඩු හා ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම ඔප මට්ටම් කිරීම.විවිධ ලී වර්ග නිවරදි ආකාරයට භාවිතා කරමින් නිසි පරිදි පිරිද්දුම් කිරීම ඇතුළු දැව නිර්මාණ ආශ්‍රිත සියළු කටයුතු<br>ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාලව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| බොයිලේරුකරු | 01 | බොයිලේරුව ක්‍රියාකරවීම හා එහි නඩත්තුවට අදාළ දෛනික කටයුතු විධිමත් පරිදි පවත්වාගෙන යාම.උෂ්ණත්වය හා පීඩන මාන පරීක්ෂා කර නිසි පරිදි සැකසීම.සතිපතා බොයිලේරුව පරීක්ෂා කර ශුද්ධ පවිත්‍ර කිරීම.<br>ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාලව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| විදුලි ශිල්පී | 01 | විදුලි උපකරණ හා විදුලි පද්ධති අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම<br>ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාලව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| යාන්ත්‍රික ශිල්පී | 02 | දෙපාර්තමේන්තුවේ ඇති යන්ත්‍ර සූත්‍ර වල හා මෝටර් වාහන වල එන්ජිම ඇතුළු කොටස් අළුත් වැඩියා කිරීම හා නඩත්තු කිරීම.<br>ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාලව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |

| අනුමත තනතුරු | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| බංගලා භාරකරු | 01 | මෙම දෙපාර්තමේන්තුවේ පවතින සංචාරක බංගලාවට පැමිණෙන අමුත්තන්ට අවශ්‍ය කෑම පිළියෙල කර දීම හා ඔවුන්ට අවශ්‍ය සෙසු පහසුකම් සැපයීම,සංචාරක බංගලා විධිමත් පරිදි නඩත්තු කිරීම,සංචාරක බංගලා හා එහි අවට නිසි පිරිසිදුකමකින් පවත්වා ගෙන යාම ඒවා ආරක්ෂා කර ගැනීම,සංචාරක බංගලාවේ පවතින ද්‍රව්‍ය හා උපකරණ ලැයිස්තු නිසි පරිදි පවත්වා ගෙන යාම ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාලව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 03 | මෙම දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන සත්ත්ව අභිජනන, සත්ත්ව පර්යේෂණ හා ආදර්ශන, සත්ත්ව ගොවිපොලවල පස්, පොහොර, තණකොල, සත්ත්ව ආහාර හා අපද්‍රව්‍ය ආදිය ප්‍රවාහනය කිරීම, ක්ෂේත්‍රයේ බිම් සැකසීම හා රෝගී සතුන් ප්‍රවාහනය කිරීම හා මළ සතුන් ප්‍රවාහනය කිරීම ආදී සියලු කටයුතු තනතුරට අදාලව ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන් |

6.2 <u>ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව</u> :

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III ,II , I හා විශේෂ ශ්‍රේණිය යන සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

| | | |
|---|---|---|
| රසායනාගාර සහායක | - | 27 |
| වඩුකරු | - | 03 |
| බොයිලේරුකරු | - | 01 |
| විදුලි ශිල්පී | - | 01 |
| යාන්ත්‍රික ශිල්පී | - | 02 |
| බංගලා භාරකරු | - | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | - | 03 |
| එකතුව | | 38 |

සටහන :- ශ්‍රේණිගතව කාර්යයන් වෙන්කිරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණය යටතේ වූ අදාල තනතුරට නියමිත කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාව පදනම් කොට ඕනෑම ශ්‍රේණියක සේවකයෙකුට ආයතන ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1බඳවා ගැනීමේ අනුපාතය :-

| තනතුර | ධාරාව | | |
| --- | --- | --- | --- |
| | විවෘත ප්‍රතිශතය | සීමිත ප්‍රතිශතය | කුසලතා |
| රසායනාගාර සහායක | 50% | 50% | |
| වඩුකරු | 50% | 50% | |
| විදුලි ශිල්පී | 100% | නැත | |
| යාන්ත්‍රික ශිල්පී | 50% | 50% | |
| බොයිලේරුකරු | 100% | නැත | අදාල නැත |
| බංගලා භාරකරු | 100% | නැත | |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 100% | නැත | |
| | 28/66/40% | 40% 33.34% | |

7.2 විවෘත බඳවා ගැනීම -

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : 111 ශ්‍රේණිය

7:2:2 සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් සඳහා

| තනතුර | 7.2.2.1අධ්‍යාපන සුදුසුකම් | 7.2.2.2 වෘත්තිය සුදුසුකම් | 7.2.2.3 පළපු |
| --- | --- | --- | --- |
| රසායනාගාර සහායක | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී, යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම | ජාතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තිය කුසලතාවන්හි (N.V.Q.) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක රසායනාගාර කටයුතු පිළිබඳව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. | රසායනාගාරයක වසර 02 ක සේ පළපුරුද්දක් පිළිග ආයතනයකින් ලබ තිබිය යුතුය. එ පළපුරුද්ද සහති මඟින් සනාථ කළ යුතුය. |
| වඩුකරු | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම | ජාතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තිය කුසලතාවන්හි (N.V.Q.) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක වඩු කාර්මික කටයුතු පිළිබඳව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. | වඩු කර්මාන්තය පිළිබඳව වසර 02 ක සේවා පළපුරුද්දක් පිළිගත් ආයතනයකින් ල තිබිය යුතුය. එ පළපුරුද්ද ( මඟින් සනාථ යුතුය. |
| විදුලි ශිල්පී | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම | ජාතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තිය කුසලතාවන්හි (N.V.Q.) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක විදුලි ශිල්පීය කටයුතු පිළිබඳව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. | විදුලි කාර්මික පිළිබඳව වසර සේවා පළපුරු පිළිගත්ආයතන න් ලබා තිබිය ... එම පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතු |

| තනතුර | 7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් | 7.2.2.2 වෘත්තිය සුදුසුකම් | 7.2.2.3 පළපුරුද්ද |
|---|---|---|---|
| බොයිලේරුකරු | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. | තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක බොයිලේරුකරු කටයුතු පිළිබඳව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. | අදාල ක්ෂේත්‍රයේ වසර 02 ක සේවා පළපුරුද්දක් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය. එම පළපුරුද්ද සහතික මඟින් සනාථ කල යුතුය. |
| යාන්ත්‍රික ශිල්පී | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. | තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක යාන්ත්‍රික ශිල්පීය කටයුතු පිළිබඳව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. | අදාල ක්ෂේත්‍රයේ වසර 02-ක සේවා පළපුරුද්දක් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය. එම පළපුරුද්ද සහතික මඟින් සනාථ කල යුතුය. |
| බංගලා භාරකරු | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. | තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක පෙර අපර දිග ක්‍රම දෙකටම ආහාර පිළියෙල කිරීම පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. | අදාල ක්ෂේත්‍රයේ වසර 02 ක සේවා පළපුරුද්දක් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය. එම පළපුරුද්ද සහතික මඟින් සනාථ කල යුතුය. |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. | තනතුරෙහි කාර්යය භාරයට අදාලව තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවයන්හි (N.V.Q.) හතර (04) වන මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල ඉඩම් වාහන පැදවීම පිළිබඳ බලපත්‍රයක් ලබා තිබීම. | බලපත්‍රය ලද පසු අවම වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්දක් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය. එම පළපුරුද්ද සහතික මඟින් සනාථ කල යුතුය. |

**7.2.2.4 කායික සුදුසුකම් :** සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**7.2.2.5 වෙනත් :**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7:.2.3 වයස

7:2:3:1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

7:2:3:2 උපරිම සීමාව : අවුරුදු 45 ට නොවැඩි

(රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන අය ස
වයස් සීමාව අදාළ නොවේ)

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් සහ ව්‍යුහගත පරීක්ෂණයක ප්‍රතිඵල මත පළමුව වෘත්තීය පරීක්ෂණය පවත්වනු ලැබේ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් අපේක්ෂකයින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. වෘත්තීය පරී හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණු වල එකතුව අනු අනුපිළිවෙලින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය - අදාල නොවේ

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමා |
|---|---|---|
| 1. ක්ෂේත්‍රයට අදාල මූලික දැනුම | 20 | 40% |
| 2. උපකරණ සවි කිරීම, අළුත්වැඩියා කිරීම පිළිබඳ දැනුම | 20 | |
| 3. අදාල ක්ෂේත්‍රයේ උපකරණවල දෝෂ හඳුනා ගැනීම පිළිබඳ දැනුම | 40 | |
| 4. ක්ෂේත්‍රයට අදාල උපකරණ භාවිතය පිළිබඳ දැනුම | 20 | |
| එකතුව | 100 | |

7.2.4.2.1. පවත්වන බලධරයා : සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනර
විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

7.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම්ද පරීක්ෂා ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාල නොවේ |
| 02. අතිරේක වෘත්තීය පුහුණුව | 60 | |
| 03. අතිරේක පළපුරුද්ද | 10 | |
| 04. අමතර සුදුසුකම් | 10 | |
| 05.සම්මුඛ පරීක්ෂණයේදි පිළිඹිබු කරන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

සටහන -: වෘත්තිය පරීක්ෂණයෙන් සමත් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවාගනු ලැබේ.

7.2.4.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

7.2.4.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: අදාල නොවේ

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3.සීමිත බඳවා ගැනීම් :

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය : 111 ශ්‍රේණිය

7.3.2. සුදුසුකම්

| තනතුර | 7:3:2:1අධ්‍යාපන සුදුසුකම් | 7:3:2:2වෘත්තිය සුදුසුකම් | 7:3:2:3 පලපුරුද්ද | 7:3:2:4කායික සුදුසුකම් | 7:3:2:5 වෙනත් |
|---|---|---|---|---|---|
| රසායනාගාර සහායක | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් සමත් වී තිබීම. | තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තිය කුසලතාවන්කි (N.V.Q.) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක රසායනාගාර කටයුතු පිළිබඳ ප්‍රවීණතාවයක් අත්කර ගෙන තිබිය යුතුය. | රසායනාගාරයක වසර 02 ක සේවා පලපුරුද්දක් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය. එම පලපුරුද්ද සහතික මගින් සනාථ කල යුතුය. | සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන තනතුරක යටත් පිරිසෙයින් අවුරුදු පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර තනතුරේ ස්ථිර කර තිබිය යුතුය.<br><br>තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය |
| වඩුකරු | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් සමත් වී තිබීම. | තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තිය කුසලතාවන්කි (N.V.Q.) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක වඩු කාර්මික ශිල්පීය කටයුතු පිළිබඳ ප්‍රවීණතාවයක් අත්කර ගෙන තිබිය යුතුය. | වඩු කාර්මික ශිල්පය පිලබඳ වසර 02 ක සේවා පලපුරුද්දක් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය. එම පලපුරුද්ද සහතික මගින් සනාථ කල යුතුය. | සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන තනතුරක යටත් පිරිසෙයින් අවුරුදු පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර තනතුරේ ස්ථිර කර තිබිය යුතුය.<br><br>තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය |

| තනතුර | 7:3:2:1අධ්‍යාපන සුදුසුකම් | 7:3:2:2වෘත්තීය සුදුසුකම් | 7:3:2:3 පළපුරුද්ද | 7:3:2:4කායික සුදුසුකම් | 7:3: |
|---|---|---|---|---|---|
| යාන්ත්‍රික ශිල්පී | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් සමත් වී තිබීම. | තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක යාන්ත්‍රික ශිල්පීය කටයුතු පිළිබඳ ප්‍රවීණතාවයක් අත්කර ගෙන තිබිය යුතුය. | යාන්ත්‍රික ශිල්පය පිළිබඳ වසර 02 ක සේවා පළපුරුද්දක් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය. එම පළපුරුද්ද සහතික මඟින් සනාථ කල යුතුය. | සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. | සත...<br>හා ...<br>දෙපා...<br>වේ ප්‍ර...<br>ශ්‍රේණි...<br>ශිල්පී...<br>තනතු...<br>පිරිසෙ...<br>අවුරු...<br>(05) ...<br>කාලය...<br>සම්පූ...<br>තනතු...<br>කර ති...<br>යුතුය.<br>තනතු...<br>ගැනීම...<br>අවශ්‍ය...<br>සපුරා...<br>යුතුය |
| වැක්වර් ක්‍රියාකරු | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් සමත් වී තිබීම. | තනතුරෙහි කාර්යය භාරයට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q.) හතර (04) වන මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල ඉඩම් වාහන පැදවීම පිළිබඳ බලපත්‍රයක් ලබා තිබීම. | බලපත්‍රය ලද පසු අවම වශයෙන් වසර තුන (03) ක සේවා පළපුරුද්දක් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය. එම පළපුරුද්ද සහතික මඟින් සනාථ කල යුතුය. | සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. | සතව ...<br>හා සෙ...<br>දෙපාර්...<br>ව ප්‍රාථමි...<br>ශ්‍රේණියේ...<br>නොවන...<br>යටත් ප...<br>අවුරුදු ...<br>හෝ ප්‍රා...<br>ශ්‍රේණියේ...<br>ශිල්පීය ...<br>යටත් පිරි...<br>අවුරුදු 0...<br>සේවා කා...<br>සම්පූර්ණ...<br>තනතුරේ ...<br>කර ති...<br>තනතුරට ...<br>ගැනීම සඳ...<br>අවශ්‍ය සිය...<br>සුදුසුකම් සම්පූර්ණ ...<br>යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/<br>ගැසට් පත්‍රයේ සඳහන් කර...<br>ලබන දිනට ...<br>සුදුසුකම් සෑ...<br>ආකාරයකින් සම්පූර්ණ කර...<br>තිබිය යුතුය. |

7.3.3. බඳවා ගැනීමේ ක්‍රමය :

වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.3.3.1. වෘත්තිය පරීක්ෂණය :

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ක්ෂේත්‍රයට අදාල මූලික දැනුම | 20 | 40% |
| 2. උපකරණ සවි කිරීම, අළුත්වැඩියා කිරීම පිළිබඳ දැනුම | 20 | |
| 3. අදාල ක්ෂේත්‍රයේ උපකරණවල දෝෂ හඳුනා ගැනීම පිළිබඳ දැනුම | 40 | |
| 4. ක්ෂේත්‍රයට අදාල උපකරණ භාවිතය පිළිබඳ දැනුම | 20 | |
| එකතුව | 100 | 40% |

7.3.3.1.1. පවත්වන බලධරයා : සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

7.3.3.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ

සටහන -: වෘත්තිය පරීක්ෂණයෙන් සමත් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් කුශලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවාගනු ලැබේ.

7.4. කුසලතා මත බඳවා ගැනීම : අදාල නොවේ

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතාකඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තිය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03)ක් ගතවීමට පෙර | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය හා වාචික පරීක්ෂණ. (ඇමුණුම 01) |
| 2.වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් කිරීමෙන් වසර තුන (03) ක් ගත වීමට පෙර. | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය හා වාචික පරීක්ෂණ (ඇමුණුම 02) |
| 3වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් කිරීමෙන් වසර පහ (05) ක් ගතවීට පෙර. | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය හා වාචික පරීක්ෂණ (ඇමුණුම 03) |

8.2 පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වර්ෂයකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

| | | |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | } | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේ |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | | අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | | පරීක්ෂණ මණ්ඩලයක් විසින් |

.09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව

9.1

| ශ්‍රේණිය | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් බැඳුනු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා පරිවාස කාලය තුල ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 <u>111 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණියට උසස් කිරීම</u>

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :-

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම
ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.
iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. උසස් වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (5) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
v. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.
vi. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

ඊ/

10.1.2 සුවිශේෂී කාර්ය සාධනය අනුව :-

10.1.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. සේවා ගණයෙහි III ශ්‍රේණියේ වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06) ම නියමිත දිනට උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර හය(06) තුලම සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස් වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

vi. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුල ලබා තිබීම.

10.1.2.2 උසස් කිරීමේ ක්‍රමය : ඉහත සුදුසුකම් සපුරාලන නිලධරයන්ට පත කිරීම් බලධරයා අනුමත කරන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත අභියෝගතා පරීක්ෂණයකට පෙනී සිටිය හැකිය. ඉන් සමත්වන්නන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ අදාළ සෙසු අවශ්‍යතාවන්ද සම්පූර්ණ කර ඇති සේවකයන් පත්කිරීමේ දින සිට වසර 06 ක් සම්පූර්ණ වන දිනට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

(අභියෝගතා පරීක්ෂණයේ විෂය නිර්දේශය - ඇමුණුම 04 මගින් දැක්වේ.)

සටහන:

i. සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් ලබා දීමේදී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත්වීම සඳහා අවම විෂයෙන් ලකුණු 60%ක් ලබා ගත යුතුය.තවද, සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණය වර්ෂයකට එක් වරක් පවත්වනු ලබන අතර නිලධරයෙකුට පෙනී සිටිය හැක්කේ එක් වතාවක් පමණි.

ii. නිලධරයෙකුට පාලනය කළ නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හිදී පසුව පැවැත්වෙන අභියෝගතා පරීක්ෂණයට එම නිලධාරියාට පෙනී සිටිය හැක. එවැනි නිලධරයෙකු සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත් වූ දිනය වේ.

10.2 <u>11 ශ්‍රේණියේ සිට 1 ශ්‍රේණියට උසස් කිරීම</u>

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :-

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09)ක සක්‍රිය හා සතුටුදායක කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ම උපයාගෙන තිබීම.

ii. උසස් වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවාකාලයක් සම්පූ තිබීම.

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පර්පාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වස (09) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයන් විසින් නියමිත ආකෘති ප්‍රා පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධරයා සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියා වන පරිදි I ශ්‍රේණියට උසස් වීම් පත්වීම් බලධරයා විසින් සිදුකරනු ලැ

10.2.2 සුවිශේෂී කාර්ය සාධනය අනුව :-

10.2.2.1 සපුරාලිය යුතු සුදුසුකම්:-

i. සේවා ගණයේ II ශ්‍රේණියේ වසර අට (08) ක සක්‍රිය හා සතුටුදායක සේවා කා සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක අට (08) ම නියමිත දිනට උපයා ගෙන තිබීම

ii. උසස් වීම් දිනට පූර්වාසන්න වසර පහ (05 ) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ තිබීම

iii. අනුමත කාර්ය සාධනය ඇගයීමේ පර්පාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වස (08) ක් තුළම සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.2.2 උසස් කිරීමේ ක්‍රමය :- සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් සඳහා පත්කිරීම් බලධරයා වි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එම ව්‍යුහගත සම් පරීක්ෂණයෙන් 50% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ග නිලධරයන් 11 ශ්‍රේණියට උසස් වී වසර අට(08) ක් සම්පූර්ණ වන දින ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් කරනු ලැබේ

( ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදීමේ පර්පාටිය ඇමුණුම හි දැක්වේ.)

10.3 <u>I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>

10.3.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන තිබීම.

ii. උසස් කිරීමේ දිනට I ශ්‍රේණියේ වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.3.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

සංලක්ෂය:- සුවිශේෂී කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වා දී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්ය සාධන ඇගයීමේදී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරනු ලැබ ඇති තැනැත්තන්ට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වන ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණය/ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

11. තනතුරුවලට පත් කිරීම :- අදාල නොවේ

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : අදාල නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන සභා කාර්යපරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :

සක්‍රිය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියේ යෙදී සිටි සේවා කාලය වේ.රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩුහැර අතිකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහනය : බඳවා ගැනීම් පරිපාටි ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතු වූවන් සඳහා පමණක් අදාලවේ. ( අන්තර්ග්‍රහණය කරන ක්‍රමවේදය ඇමුණුම 05 මගින් දැක්වේ )

15.මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කලේ : අත්සන ..................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ..................

තනතුර : සහකාර අධ්‍යක්ෂ ( පරිපාලන )

දිනය : සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ගෙතැලි පෙනුව

පරීක්ෂා කලේ : අත්සන ..................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ..................

තනතුර : ..................

දිනය : ..................

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..................

තනතුර : ..................

නිල මුද්‍රාව: ..................

දිනය : ..................

යොමු අංකය : MLRCD/ES/08/01-04

සත්ව නිෂ්පාදන හා

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හි [illegible]

සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : [signature]

නම :

Dr. K. M. T. Kendaragama
ලේකම්
Secretary
Ministry of Livestock and Rural
Community Development
No 45, St. Michael's Road
Colombo 03

අමාත්‍යාංශය

දිනය : 7/1/2013

නිල මුද්‍රාව :

********************************

යොමු අංකය : PSC/EST/5/1/6/1/2012

සත්ව නිෂ්පාදන හා

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හි ප්‍රාථමික ශ්‍රේණි ශිල්පීය සේවා [illegible] සඳහා වන

මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2012.09.27 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : [signature]

නම :

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2013 02 01

නිල මුද්‍රාව : ඩී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

ඇමුණුම 01

## I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

1. මෙම කාර්යක්ෂමතා කඩඉම වාචික පරීක්ෂණයකි
2. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකුගෙන් යුත් පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලැබේ.
3. සාමාර්ථය සඳහා ලකුණු 40% ක් ලබාගත යුතුය
4. පරීක්ෂණය වසරකට දෙවරක් පවත්වනු ලැබේ.
5. ලකුණු ලබා දෙනු ලබන නිර්ණායකයන් පහත සඳහන් පරිදි වේ.

| ලකුණු ලබා දෙනු ලබන නිර්ණායකයන් | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| (අ) * අදාල සේවකයා තමා සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳව අවශ්‍යවන පරිදි දැනුම ලබා ඇත්දැයි මැන බැලීම | 30 | 40% |
| (ආ) * සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තම සේවයට අදාල දැනුම | 30 | |
| (ඇ) * තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ අවශ්‍ය වන දැනුවත් හා ප්‍රවීණතාවයන් අත්පත් කරගෙන ඇත්දැයි මැන බැලීම | 40 | |

සකස් කළේ :

අත්සන : ..........

නම : ටී. ජී. ජයසේන

තනතුර : සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)

දිනය : 2012.11.23

පරීක්ෂා කළේ :

අත්සන : ..........

නම : සී.එච්. කුරුකුලසූරිය

අධ්‍යක්ෂ (පරිපාලන)

තනතුර : සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ගැටඹේ, පේරාදෙණිය

දිනය : 2012-11-26

අත්සන : ..........

( දෙපාර්තමේන්තු ප්‍රධාන) නිලධාරී

නම : ..........

තනතුර : ..........

දිනය : 2012-11-29

නිල මුද්‍රාව : වෛද්‍ය ඩී.ආර්.ඩී.කේ. රත්නායක
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
පශු සම්පත් සංවර්ධන (රා.ආ.)

ඇමුණුම 02

## II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

1. මෙම කාර්යක්ෂමතා කඩඉම වාචික පරීක්ෂණයකි
2. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන මාණ්ඩලික නිලධාරීන් තිදෙනකුගෙන් යුත් පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලැබේ.
3. සාමාර්ථය සඳහා ලකුණු 40% ක් ලබාගත යුතුය
4. පරීක්ෂණය වසරකට දෙවරක් පවත්වනු ලැබේ.
5. ලකුණු ලබා දෙනු ලබන නිර්ණායකයන් පහත සඳහන් පරිදි වේ.

| ලකුණු ලබා දෙනු ලබන නිර්ණායකයන් | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| * පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙදි ආවරණය වූ විෂයන්ට අදාලව ගතවූ සේවා කාලය තුල අදාල ක්ෂේත්‍රය තුල සිදුවී ඇති පරිපාටිමය වෙනස්වීම් පිළිබඳ සේවකයාගේ දැනුම සහ ඔහුගේ කාර්යයන්ට අදාල නව්‍යකරණයන් පිළිබඳ සේවකයාගේ කුසලතා මැන බැලීම. | 100 | 40% |

සකස් කළේ :

අත්සන : [illegible]

නම : [illegible]

තනතුර : සහකාර අධ්‍යක්ෂ ([illegible])

දිනය : 2012.11.23

පරීක්ෂා කළේ :

අත්සන : [illegible]

නම : සී.එච්. [illegible]

තනතුර : [illegible] සත්ව [illegible]

දිනය : 2012-11 [illegible], පේරාදෙණිය

අත්සන : [illegible]

(දෙපාර්තමේන්තු ප්‍රධාන) [illegible]

නම :

තනතුර :

දිනය : 2012-11-29

නිල මුද්‍රාව : වෛද්‍ය ඩී.ආර්.ටී.පී රත්නායක
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
පශු සම්පත් සංවර්ධන (රා.ආ.)
[illegible]

ඇමුණුම 03

## III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

1. මෙම කාර්යක්ෂමතා කඩඉම වාචික පරීක්ෂණයකි
2. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු භාණ්ඩලික නිලධාරීන් තිදෙනකුගෙන් යුත් පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලැබේ.
3. සාමාර්ථය සඳහා ලකුණු 40% ක් ලබාගත යුතුය
4. පරීක්ෂණය වසරකට දෙවරක් පවත්වනු ලැබේ.
5. ලකුණු ලබා දෙනු ලබන නිර්ණායකයන් පහත සදහන් පරිදි වේ.

| ලකුණු ලබා දෙනු ලබන නිර්ණායකයන් | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| * පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී ආවරණය වූ විෂයන්ට අදාලව ගතවූ සේවා කාලය තුල අදාල ක්ෂේත්‍රය තුල සිදුවී ඇති පරිපාටිමය වෙනස්වීම් පිළිබඳ සේවකයාගේ දැනුම සහ ඔහුගේ කාර්යයන්ට අදාල නව්‍යකරණයන් පිළිබඳ සේවකයාගේ කුසලතා මැන බැලීම. | 100 | 40% |

සකස් කළේ :

අත්සන :.........................

නම : වී. සී. ජයසේන

තනතුර : සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)

දිනය : 2012 . 11 . 23

පරීක්ෂා කළේ :

අත්සන :.........................

නම : සී.එච්. කුරුකුලසූරිය
අධ්‍යක්ෂ (පරිපාලන)

තනතුර : සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ගැටඹේ, පේරාදෙණිය

දිනය : 2012 -11 - 26

අත්සන :.........................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :.........................

තනතුර :.........................

දිනය : 2012 - 11 - 29

නිල මුද්‍රාව : වෛද්‍ය බී.ආර්.වී.පී රත්නායක
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
පශු සම්පත් සංවර්ධන (වා.ආ.)

අධ්‍යක්ෂ ජනරාල් / වෙනුවට

ඇමුණුම 0

01. විභාගයේ නම :- සුවිශේෂී කාර්ය සාධනය සඳහා උසස් වීම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝගාත්මක පරීක්ෂණය | පැය 01 | 100 | 60% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා:- සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :- අවශ්‍යතාවය පරිදි වර්ෂයකට වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශ :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝගාත්මක පරීක්ෂණය | තමා වෙත පැවරෙන කාර්යන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යු[illegible] කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කරගෙන තිබේද යන්න [illegible] ගාවිතයේදී ඉහළ ප්‍රවීණතාවයක් දක්වන්නේ ද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. |

සකස් කළේ :

අත්සන : ..................

නම : ටී. ජී. ජයසේන

තනතුර : සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)

දිනය : 2012.11.23

පරීක්ෂා කළේ :

අත්සන : ..................

නම : ..................

තනතුර : ..................

දිනය : 2012-11-26

අත්සන : ..................

( දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ..................

තනතුර : ..................

දිනය : 2012/11/27

නිල මුද්‍රාව : ..................

Dr. D. R. T. G. Ratnayake
Addl. Director General
Livestrock Development ...

අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කිරීම (බඳවා) ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන

දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ.

නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006(IV) මගින් ලබා දී ඇති

PL-2-2006 (ඒ) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන සේවකයින් සියලු දෙනාම නව බඳවා ගැනීමේ පටිපාටිය

ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට

අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ ශ්‍රේණියට පත් කරන ලද දිනයේ සිටම

පුනරීක්ෂණය කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයේ වෙනසක් සිදු නොවිය

යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතු

එසේම වැටුප් පරිවර්තනයේදී අදාල තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූප

වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරට හැඹිලීම සිදු නොකළ

යුතුය.

*** (I). PL-2-III ශ්‍රේණිය**

(අ) PL-2-2006 (ඒ) වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක

යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්

(ආ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක හෝ ඊට වැඩි

සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින

**PL-2-III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.**

***(II) PL-2-II ශ්‍රේණිය**

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක හෝ ඊට වැඩි

සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම එම වශයෙන් අවුරුදු දහයක (10)

එනෙත් අවුරුදු 20 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව

සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්

පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්

(ආ) PL-2-2006 (ඒ) වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක

යටත් පිරිසෙයින් වසර 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 09 ක් සම්පූර්ණ වුවද එහෙත්

බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව I ශ්‍රේණියට

උසස් වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

**PL-2-II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.**

***(III) PL-2-I ශ්‍රේණිය**

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 20 ක හෝ

එහෙත් අවුරුදු 30 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුළ

(20)ක් උසස්වීමක් ලබා ඇති හා නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති

පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 09 ... එහෙත් අවුරුදු 19 කට අඩු සේවා කාලයක් ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක නවයක් ල... හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්

(ඇ) PL-2-2006 (ඒ) වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක ශ්‍රේ... යටත් පිරිසෙයින් වසර 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්

(ඈ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය අවුරුදු 09 සම්... විශේෂ ශ්‍රේණියට උසස් වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

**PL-2-I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.**

***(IV) PL-2-විශේෂ ශ්‍රේණිය**

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 30 ක සේවා... සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක තිහක (30)ක් උපයාගෙන ඇති හා නව බඳවා... පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය අනෙකු... අවශ්‍යතා සපුරා ඇති සේවකයන්

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 19 ක සේවා... සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක දහනවයක(19) ක් උපයා ගෙන ඇති හා ඉහත... අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්

(ඇ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 09 ක සේවා ක... සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක නවයක(09) ක් උපයාගෙන ඇති හා ඉහත... අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්

(ඈ) *PL-2-2006 (ඒ) වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක... ශ්‍රේණියක් යටතේ වැටුප් ලබන සේවකයින්

**PL-2-විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.**

සකස් කලේ:
අත්සන: ..........
(විධායක කළමනාකරණ මාණ්ඩලික නිලධාරී)
නම: ..........
තනතුර: ..........
දිනය: .......... 11.23

පරීක්ෂා කලේ:
අත්සන: ..........
(විධායක ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී)
නම: ..........
තනතුර: ..........
දිනය: ..........

අත්සන: ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම: ..........වෛද්‍ය ඩී.ආර්.ටී.පී රත්නායක
තනතුර: ..........අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
දිනය: ..........පශු සම්පත් සංවර්ධන (රා.ආ.)
නිල මුද්‍රාව: ..........

ප්‍රධාන ජනරාල් / රත්නායක

ඇමුණුම 06

## : සුවිශේෂී කාර්ය සාධනය යටතේ 1 ශ්‍රේණියට උසස් වීම් කිරීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ පරිපාටිය

1. මෙම පරීක්ෂණය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකි
2. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකුගෙන් යුත් පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලැබේ.
3. සාමාර්ථය සඳහා ලකුණු 50% ක් ලබාගත යුතුය.
4. පරීක්ෂණය අවශ්‍යතාවය මත පවත්වනු ලැබේ.
5. ලකුණු ලබා දෙනු ලබන නිර්ණායකයන් පහත සඳහන් පරිදි වේ.

| පරීක්ෂා කර ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රාජකාරි කටයුතු වලදී ආයතනයට දක්වන ලද විශේෂ දායකත්වයන් (එක් දායකත්වයක් සඳහා ලකුණු 05 බැගින්) | 50 | |
| 2. කාර්ය සාධන ඇගැයීම (උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 සඳහා)<br>ඉතා හොඳයි - ලකුණු 09<br>හොඳයි - ලකුණු 06<br>සතුටුදායකයි - ලකුණු 03 | 45 | 50% |
| 3. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| • මුළු එකතුව | 100 | |

සකස් කළේ :

අත්සන : ........................

නම : සී. ජී. ජයසේකර

තනතුර : සහකාර අධ්‍යක්ෂ (පරිපාලන).

දිනය : 2012.11.23

පරීක්ෂා කළේ :

අත්සන : ........................

නම : ජී.එම්. කුරුකුලසූරියආරච්චි අධ්‍යක්ෂ (පරිපාලන)

තනතුර : සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ගැටඹේ, පේරාදෙණිය

දිනය : 2012-11-26

අත්සන : ........................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ........................

තනතුර : ........................

දිනය : 2012-11-29

නිල මුද්‍රාව : වෛද්‍ය බී.ආර්.ටී.පී. රත්නායක
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
පශු සම්පත් සංවර්ධන (රා.ආ.)
අධ්‍යක්ෂ ජනරාල් / වෙනුවට